DOI: https://doi.org/10.4038/jdrra.v2i1.33

The Journal of Desk Research Review and Analysis, Vol. 2, Issue 1, 2024, 157-168

A STUDY OF THE SOCIAL ENVIRONMENT OF VARIOUS PROFESSIONS AND PROFESSIONALS INVOLVED IN THE POLITY OF ANCIENT SRI LANKA

RMGW Dissanayaka[1]

Abstract

The Pūrva and Apara Brāhmī inscriptions, written between the 3rd century BC and the 1st century AD, serve as a mirror reflecting the various professions and professionals, their social environment, and their status within the polity of ancient Sri Lanka. In the ancient government organization of Sri Lanka, there appears to have been a system of officialdom, including positions such as Minister, Treasurer, General, Inspector of Accounts, and others. These officials became more organized within the state structure following the coronation of King Duṭṭhagāmini. (161 – 137 BC) However, this article does not focus on these professions or their titles. Instead, its primary purpose is to uncover the various types of professions established within the government organization, the individuals engaged in these professions, and their status in the social environment of that time. Through the Brāhmī inscriptions, we can identify the established professions, their functions within the state organization of ancient Sri Lanka, the individuals engaged in these professions, and the true nature of their social conditions. This research aims to highlight these aspects. As mentioned above, it was possible to identify numerous individuals who held positions such as minister, general, treasurer, and accountant within the state organization through the Brāhmī inscriptions. The leading positions in the government organization were held mainly by those recognized as superior in the social hierarchy, often with titles like Parumakaand Gamika, who held significant societal roles. Given that these individuals led the social organization and villages at the time, it can be concluded that King Dutugemunu likely gathered parumakas and gamikaswith experience in governance and social management while building the state organization centred in Anuradhapura. It appears that the state organization at that time was well-established based on their experience, loyalty to the king, and trust in the king. Additionally, the Brāhmī inscriptions reveal that these officials received significant recognition and status within the social organization of that era.

Keywords: Brahmi Inscriptions, Government Organization, Professions and Professionals, Social Environment, The Polity of Ancient Sri Lanka.

[1] Senior Lecturer, Department of History, University of Kelaniya, , Sri Lanka

Email: wasanthad@kln.ac.lk ' https://orcid.org/0009-0003-7096-4112

The Journal of Desk Research Review and Analysis © 2024 by The Library, University of Kelaniya, Sri Lanka is licensed under CC BY-SA 4.0

Received date: 25.07.2024
Accepted date: 22.10.2024

පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය තන්ත්‍රයට සම්බන්ධ විවිධ වෘත්තීන් හා වෘත්තිකයන්ගේ සමාජ පරිසරය පිළිබඳ අධ්‍යයනයක් (පූර්ව හා අපර බ්‍රාහ්මී ශිලාලේඛන ඇසුරෙන්)

ආර්.එම්.ජී. වසන්ත දිසානායක

සාරසංක්ෂේපය

ක්‍රි. පූ. දෙවන සියවසේ දුටුගැමුණු රජුගේ රාජ්‍ය අවධියට පෙර ක්‍රි. පූ. 161 - 137 ශ්‍රී ලාංකේය රාජ්‍ය පරිපාලන සංවිධානය තුළ බහුවිධ වෘත්තීන් වැඩි වශයෙන් දක්නට ලැබෙන්නේ නැත. එයට හේතුව ලෙස සලකනු ලබන්නේ සමස්ත රාජ්‍ය ම ආවරණය වන ආකාරයේ පරිපාලන සංවිධානයක් ඒ වන විට ගොඩනැගී නොතිබුණු බැවිනි. විකේන්ද්‍රගත දේශපාලන පරිසරයක් වෙනුවට අනුරාධපුර රාජධානිය කේන්ද්‍ර කර ගෙන සංකේන්ද්‍රගත පාලන සංවිධානයක් දුටුගැමුණු රජ අවධියේ දී ගොඩනැගුණු බැවින් ශ්‍රී ලාංකේය රාජ්‍ය නමැති සංවිධානය තුළ බහුවිධ වෘත්තීන් රැසක් නිර්මාණය වුණි. රාජ්‍ය තන්ත්‍රයේ විශාල ක්‍රියාකාරිත්වයක් හා බලයක් සහිත එම වෘත්තීන්හී නියැලී සිටි පුද්ගල චරිතයන්ට සමකාලීන සමාජ පරිසරය තුළ සුවිශේෂිත වූ සමාජමය තත්ත්වයක් මෙන්ම ආර්ථික ශක්තියක් පැවති බව බ්‍රාහ්මී ශිලා ලේඛන මූලාශ්‍රය ඇසුරෙන් අනාවරණය කර ගත හැකි ය. සෙන්පති, අමාත්‍ය, භාණ්ඩාගාරික, ගණක, අදෙක හා කෝෂ්ඨාගාරික ආදි වෘත්තීන් ඍජුව ම රාජ්‍ය සංවිධානයට සම්බන්ධ තනතුරු ලෙස හඳුනා ගැනීමට හැකි අතර එම වෘත්තීන්හී නියැලී සිටි පුද්ගලයන් හා ඔවුන්ගේ සමාජ පරිසරයත් ඔවුන්ට එකල සමාජය තුළ හිමි වී තිබූ සමාජ තත්ත්වයත් මේ ලිපියෙන් අධ්‍යයනයට ලක් කෙරේ. පුස්තකාලීය මූලාශ්‍ර අසුරෙන් මීට අදාළ දත්ත එක්රැස් කරන ලදී.

ප්‍රමුඛ පද **:** බ්‍රාහ්මී සෙල්ලිපි, පැරැණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය, වෘත්තීන් හා වෘත්තිකයන්, සමාජ පරිසරය, රාජ්‍ය සංවිධානය

හැඳින්වීම

රාජ්‍යය තන්ත්‍රයට සම්බන්ධ වූ විවිධ වෘත්තීන්, නිලධාරීන් හා ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය

කිසියම් තැනැත්තෙක් යම් පුද්ගලයකු කෙරෙහි හෝ ආයතනයක් වෙනුවෙන් සේවා සපයා මුදලක් හෝ දිවෙල් ක්‍රමයක් (ජීවිතය පවත්වාගෙන යාම සඳහා ලබන දීමනාවක්) උපයා ගන්නේ ද එම සේවාව හා බැඳි ක්‍රියාවලිය වෘත්තියක් එසේත් නොමැති නම් රැකියාවක් ලෙසින් අර්ථ ගැන්විය හැකි ය. දුට්ඨගාමිණී රජ අවධියේ (ක්‍රි. පූ. 161 - 137) සිට රාජ්‍ය නමැති ආයතනය සංවිධානාත්මක ස්වරූපයෙන් ගොඩනැගෙන විට එම ආයතනයේ විවිධ කාර්යයන් සම්පූර්ණ කිරීම සඳහා සේනාපති, මහා ඇමැති, ඇමැති, භාණ්ඩාගාරික, ගණක, අදෙක (ආදායම් අධ්‍යක්ෂක) කෝෂ්ඨාගාරික, ලේඛන ලියන්නන් ආදි වශයෙන් වේතනයක් හෝ දිවෙලක් වෙනුවෙන් රාජ්‍ය තන්ත්‍රයට සේවා සපයන ලද නිලතල පද්ධතියක් රාජ්‍ය ව්‍යුහය තුළ නිර්මාණය වුණි. රාජ්‍ය තන්ත්‍රය හා සම්බන්ධ ඉහත සඳහන් කළ නිලතල පද්ධතිය සඳහා සමකාලීන සමාජ සංවිධානය නියෝජනය කරමින් එකතු වූ විවිධ පුද්ගල චරිත පිළිබඳව මෙන්ම ඔවුන්ගේ ක්‍රියාකාරිත්වය කෙබඳු වී ද යන්න අධ්‍යයනය කිරීමට හැකි වනුයේ ඔවුන් විසින් සංඝයා වහන්සේලා උදෙසා සිදුකරන ලද විවිධ පරිත්‍යාගයන් පිළිබඳ වූ වාර්තාකරණයන් අනුසාරයෙනි. ඒ හා සම්බන්ධ තොරතුරු පූර්ව හා අපර බ්‍රාහ්මී ශිලා ලේඛනවල ඇතුළත්ව ඇති අතර එම මූලාශ්‍රයවලට වැඩි අවධානයක් යොමු කෙරේ.

සෙන්පතිවරු හා ඔවුන්ගේ සමාජ පරිසරය

''යුද හමුදාව රඳා පවතින්නේත්, රට සුරක්ෂිත වන්නේත් හමුදාවට නායකත්වය ලබා දෙන පුද්ගලයා මත ය.'' (ම. මෘ., (2001), 07: 65) යන මනුගේ අර්ථ නිරූපණයෙන් ගම්‍ය වනුයේ රාජ්‍යයේ ආරක්ෂකයා හෙවත් පාලකයා සිය හමුදාවේ උසස් නිලධරයා සම්බන්ධයෙන් දක්වන සැලකිල්ලේ ප්‍රමාණය මත භූමියත්, එහි වැසියන් මෙන්ම පාලකයාත් වඩාත් සුරක්ෂිත වන බව ය. රාජ්‍ය පාලන තන්ත්‍රයේදී පාලන කාර්යයන් වඩාත් පහසු කරලීම සඳහා රජුට ඇමති මණ්ඩලය අතිශයින් වැදගත් වන්නේ ද ඒ ආකාරයෙන් ම තමන් සමීපයේ සිටින සේනාව ද පාලකයාට අතිශයින් වැදගත් වන බව කෞටිල්‍යගේ ද අදහසයි. *''සවාමිනශ්වාසන්න වෘත්තින්වාදමාත්‍යසධමඃ දණ්ඩඃ ඉතීං''* (අ.ශා., (8 - 15) (2003), පි. 3) රාජ්‍යයේ මෙන්ම එහි වැසියන්ගේ ආරක්ෂාව හා ජීවත්වීමේ අයිතිය පිළිබඳ වගකීම හමුදාව භාර සෙන්පතිවරයාට හිමිවන බව ඉහත මූලාශ්‍රය විස්තරයන්ගෙන් ප්‍රකට වන බැවින් රාජ්‍ය තන්ත්‍රයේ දී සෙන්පති නිලයට අතිශය වැදගත්කමක් හිමි වූ බව පැහැදිලි ය.

රාජ්‍යයේ ආරක්ෂාව සුරක්ෂිත කිරීම සඳහා පාලන තන්ත්‍රයට සම්බන්ධව සිටි සෙන්පතිවරු කිහිප දෙනකු පිළිබඳ විස්තර බ්‍රාහ්මී ශිලා ලේඛන ඇසුරෙන් අනාවරණය කරගත හැකි ය. එම ශිලා ලේඛන මූලාශ්‍රය ඇසුරෙන් පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය තන්ත්‍රයට සම්බන්ධව සිටි සෙන්පතිවරු හා ඔවුන්ගේ සමාජ තත්ත්වයත්, ක්‍රියාකාරිත්වයත් මෙයින්

අධ්‍යයනයට ලක්වේ. පරුමක විරුදය දරන ලද මිත්ත නමින් හැඳින්වෙන සෙන්පතිවරයකු පිළිබඳ සඳහනක් සිතුල්පව්වේ කොරවක්ගලින් හමු වී ඇත. *''දෙවනපිය රඣ අබයශ ශෙනපති පරුමක මිතශ ලෙණෙ අගත අනගත චතු දිශ ශගශ දිණෙ''* (දෙවනපිය අබය රජුගේ සෙන්පති ප්‍රමුඛ මිත්තගේ ලෙන පැමිණි නොපැමිණි සිවු දිශාවේ සංඝයාට දෙන ලදි) (IC, Vol.I. (1970), No. 620) යන මෙම ශිලා ලේඛන විස්තරයට අනුව මෙහි සඳහන් ලෙන සංඝයා වහන්සේට පූජා කරන ලද්දේ මිත්ත විසිනි. එයින් කියැවෙන්නේ ලෙන සංඝයා වහන්සේට වාසය කිරීමට සුදුසු ආකාරයෙන් සකස් කිරීම සඳහා ධන ආයෝජනය මිත්ත විසින් සිදු කළ බව ය. මෙහි නම් සඳහන් මිත්ත සෙන්පතිවරයා වෙන කවරකුවත් නොව 'දෙවනපිය' විරුදය දැරූ අබය හෙවත් දුට්ඨ ගාමණී අබය රජුගේ ප්‍රධාන සෙන්පතිවරයා වන නන්දි මිත්‍ර බව ඉතිහාසඥයන්ගේ අදහස වී තිබේ. දුටුගැමුණු රජුගේ දස මහා යෝධයන්ගේ නම් මහාවංසයේ සඳහන්ව ඇති අතර ඒ අතුරෙන් සෙන්පති නන්දිමිත්තයන්ගේ නම සඳහන්ව ඇත්තේ සියල්ලන්ට ප්‍රථමයෙන් ය.

> *''නන්දිමිත්තො සුරනිමිලො මහාසොණො ගොඨයිම්බරො*
> *ථෙරපුත්තාභයො භරණො වෙළුසුමනො තථෙව ච''*
> *''ඛඤ්ජදෙවො ඵුස්සදෙවො ලභියවසභො පි ච''* (උෟ.පූ.ම.,(1959), 23ඃ ගාථා. 2, 3)

වංසකථාවේ එන මේ සඳහන පිළිබඳව සැලකිලිමත් වන සමහරෙක් නන්දි මිත්ත යනු දුටුගැමුණු මහ රජුගේ ප්‍රධාන සෙන්පතිවරයා ලෙසින් හඳුනා ගැනීමට උත්සාහ කරති.

මිත්ත සෙන්පති තනතුරට අමතරව සිය නම ඉදිරියෙන් 'පරුමක' නම් විරුදය දැරීමෙන් පෙන්නුම් කරනුයේ කාවන්තිස්ස රජුගේ සේනාවට එකතු වීමට පෙර ඔහු එකල සමාජයට නායකත්වය දුන් ප්‍රබල සමාජ ක්‍රියාකාරිකයකු ලෙසින් කටයුතු කරන්නට ඇති බව ය. පූර්ව රාජ්‍ය අවධියේ සිට ම (දුට්ඨගාමිණී රජුගේ රාජත්වයට පෙර අවධිය මෙනමින් හැඳින්වේ) සමාජ සංවිධානයට නායකත්වය දෙන අය ලෙස පරුමකයන් විසූ බැවින් හා එම නායකත්වය පාලන නායකත්වයේ මූලික අවස්ථාවට සම්බන්ධව සිටි නිසාත් රාජ්‍යයේ පාලන සංවිධානය බිහිවීමෙන් පසුව පාලන නායකත්වය සමඟ ඥාතීත්වයක් ඇතිකර ගැනීමේ හැකියාව ද ඔවුන් සතු විය. කුරුණෑගල දිස්ත්‍රික්කයේ සැස්සේරුවෙන් හමුවන බ්‍රාහ්මී ශිලා ලේඛනයක එන දෙවනපිය මහරජ ගමණී අබයගේ දියණිය වූ අනුරිදිය කුමරිය, පරුමක රකිගේ භාර්යාව ලෙසින් පෙනී සිටින්නී ය. *''දෙවනපිය මහරඣහ ගමණී අබයහ ඣිත අබි අනුරදිය පරුමක රකි ඣය ලෙණෙ''* (IC, (1970), No. 994)

මීට අමතරව සිතුල්පව්වෙන් හමුවන ලිපියක එන පරුමක පුශදේවගේ දියණිය වූ අනුරදිය කුමාරිය ද විවාහ වී ඇත්තේ පුශදේව නම් කුමාරයකු සමඟ ය. (IC, (1970), No. 655) මෙබඳු විවාහ සම්බන්ධතාවලින් පැහැදිලි වන්නේ පරුමකවරු හා එකල පාලක පැලැන්තිය අතර සමීප සම්බන්ධතාවයක් පැවැති බව ය. පරුමකවරු ලෙස හැඳින්වෙන අය එකල සමාජ සංවිධානයේ උසස් අය නොවේ නම් පාලකයන්ගේ දරුවන් ඔවුන්ට විවාහ කරදීමට ඉදිරිපත්වීමක් හෝ අනුකූලතාවක් දක්වන්නේ හෝ නැත. මෙයින් පැහැදිලි වනුයේ පරුමකරු යනු මෙරට පාලක පැලැන්තියට පසුව සමාජයේ බලයක් සහිතව සිටි පිරිසක් ය යන්න යි.

ඉහත සඳහන් කළ මිත්ත සෙන්පතිවරයාට අමතරව රිටිගල නා උල්පතින් හමුවන ලෙන් ලිපියකින් මහා (ප්‍රධාන) සෙන්පතිවරයකු පිළිබඳ තොරතුරක් හමුවේ. *''පරුමක උබහ ලෙණෙ දස - ශහශ දර(ය) මහ ශෙනපති කලහි කටෙ තිස මහ රඣහ රඣහි ගම (ච දි) නෙ ශගශ''* (ප්‍රමුඛ උබයගේ ලෙන මහ සෙන්පතිගේ අවධියේ දස දහසක් (දරා) වියදම් කොට කරවන ලදි. එය මහ රජ තිස්ස රාජ්‍ය කරන කල්හි ගමත් සමඟ සංඝයාට දෙන ලදි) (IC, (1970), No. 251) මෙම ලේඛනයේ සඳහන් වන ආකාරයට ලෙන අයිති වන්නේ ප්‍රමුඛ උබයට ය. ඔහු මෙම ලෙන සකස් කර ඇත්තේ මහ සෙන්පති දවස ය. තිස්ස මහ රජු රජ කරන අවධියේ මෙම ලෙන පූජා කරන ලද බව එහි සඳහන් ය. සෙන්පති නමට පූර්වයෙන් 'මහ' යන පදය භාවිත කර ඇති බැවින් පැහැදිලි වශයෙන් ම මෙයින් ප්‍රධාන සෙන්පතිවරයකු ගැන කියැවෙන බව පැහැදිලි ය. ප්‍රමුඛ උබය සිය ලෙන් පූජාවේදී මේ ආකාරයෙන් මහ සෙන්පතිවරයකු පිළිබඳව සඳහන් කරන්නට ඇත්තේ ඔහු යටතේ කිසියම් රාජකාරියක උබය නියැලී සිටි නිසා විය යුතු ය. එසේත් නොවී නම් සෙන්පතිවරයා උබය විසූ ප්‍රදේශයේ වාසය කළ බලයක් සහිත අයකු විය යුතු ය. මේ කියනු ලබන කිසිම දෙයක් නොවේ නම් මේ ආකාරයෙන් එම සෙන්පතිවරයා පිළිබඳව වාර්තාකරණයක් එහි සඳහන් කිරීම අපේක්ෂා කළ නො හැකි කරුණකි. ලේඛනයේ එන සඳහනින් පැමිණිය හැකි අනෙක් නිගමනය වනුයේ මෙහි සඳහන් මහ සෙන්පතිවරයා තිස්ස මහරජුගේ සේනාපති විය හැකි බව ය. මෙහි නම් සඳහන් තිස්ස මහ රජු කවරකු

ද යන්න නිශ්චිතව හඳුනාගත නොහැකි නමුත් ඔහු අනුරාධපුර රාජධානියට සම්බන්ධ ප්‍රධාන පාලකයකු බව පැහැදිලිව හඳුනාගත හැකි ය. එසේ හඳුනා ගැනීමට හැකි වනුයේ 'මහරඣ' යන විරුදය භාවිත කර ඇති බැවිනි. මහරඣ යන විරුදය මෙකල භාවිත කොට ඇත්තේ අනුරාධපුර පාලකයන් පමණි.

ඌව පළාතේ වැලඑල්ලූගොඩ කන්දෙන් හමුවන ලිපියකින් අග්ගිදත්ත හා වුස්සදේව නමින් හැඳින්වෙන සෙන්පතිවරු දෙදෙනකු ගැන කියැවේ.*''තිශමහරජඣහ ශෙනපතිය අගිදතහ බරියාය ශෙනපති පරුමක පුශදෙවහ ඣිතය උපශිකා නාගය ලෙණෙ ශගශ දිනෙ....''* (තිස්ස මහ රජුගේ සෙන්පති අග්ගිදත්තගේ භාර්යාව වූ සේනාපති ප්‍රමුඛ වුස්සදේවගේ දියණිය වූ උපාසිකා නාගාගේ ලෙන සංඝයාට දෙන ලදි) (IC, (1970), No. 724) මෙම ලෙන අයිති නාගා උපාසිකාව ඇයගේ ස්වාමියා වූ අග්ගිදත්ත පැහැදිලි ලෙස ම තිස්ස මහ රජුගේ සෙන්පතිවරයකු ලෙස සඳහන් කර ඇත. මෙහි නම් සඳහන් තිස්ස මහ රජු කවරකු ද යන්න නිශ්චිතව කිව නොහැකි වන නමුත් ඔහු මාගම රාජධානියේ පාලකයාව සිටි කාවන්තිස්ස මහ රජු විය හැකි යැයි අනුමාන කළ හැකි ය. ලේඛනයේ එන විස්තරයට අනුව නාගාගේ පියා වූ වුස්සදේව ද සෙන්පති තනතුර දරයි. වුස්සදේව නමින් හැඳින්වෙන මෙම සෙන්පතිවරයා කාවන්තිස්ස රජුගේ හමුදා සංවිධානයට එකතු වී සිටි දුටුගැමුණු මහරජුගේ දසමහා යෝධයන්ගෙන් අයකු විය හැකි ය. එනමින් දුටුගැමුණු මහරජුට සෙන්පතිවරයෙක් සිටි බව මහාවංසයේ සඳහන්ව ඇත. *''ඛඤ්ජදෙවො වුස්සදෙවො ...''* (ඌ. පූ. ම., (1959), 23: ගා. 3) මෙම ශිලා ලේඛනයේ නම් සඳහන් අග්ගිදත්ත හා වුස්සදේව යන දෙදෙනාම පරුමකවරු ය. එයින් ඔවුන්ගේ සමාජ තත්ත්වය ප්‍රකට කෙරෙන අතර එකල උසස් පවුල් දෙකක් අතර සිදු වූ විවාහ ගනුදෙනුවක් පිළිබඳ තොරතුරු ද මෙම ලේඛනයෙන් ප්‍රකට කෙරේ.

වැලඑල්ලූගොඩින් ම හමුවන තවත් ලිපියකින් ඉහත සඳහන් කළ ලිපියේ නම් සඳහන් සෙන්පති වුස්සදේව පිළිබඳව තොරතුරු හමු වේ. *''ශෙනපති පරුමක පුශදෙවහ ඣිත නග ශමණිය මහ ලෙණෙ ශගශ''* (සේනාපති ප්‍රමුඛ වුස්සදේවගේ දියණිය වූ නාගා ශ්‍රමණියගේ මහ ලෙන සංඝයාට) (IC, (1970), No. 725) මෙම ලේඛනයේ මෙන්ම ඉහත සඳහන් කළ ලේඛනයෙන් ද කියැවෙන ප්‍රමුඛ වුස්සදේව සෙන්පතිවරයා දෙදෙනකු නොව එක් අයකු ම බව පැහැදිලි ය. මෙම ලේඛනය අයත් වන්නේ නාගා නම් ශ්‍රමණියටයි. ඉහත ලේඛනයේ නම් සඳහන් නාගා උපාසිකාවත් මෙම ලේඛනයේ නම් සඳහන් නාගා ශ්‍රමණියත් යනු සෙන්පති වුස්සදේවගේ එක ම දියණියක් විය හැකි ය. එසේත් නොවේ නම් ඔවුන් දෙදෙනා වුස්සදේව සෙන්පතිවරයාගේ ම දියණියන් දෙදෙනකු විය යුතු ය. මෙම ලිපි දෙකෙන් කියැවෙන නාගා යනු සහෝදරියන් දෙදෙනෙක් නම් ඔවුන් ලොකු හෝ මහා යනුවෙන් හඳුන්වාදිය යුතු ය. එසේ හඳුන්වා නොදී මේ ආකාරයෙන් පෙනී සිටීමෙන් පෙනී යනුයේ වරෙක උපාසිකාවක් වශයෙන් සිටි නාගා පසුව ශ්‍රමණියක් බවට පත්ව ගිහිකල හැඳින් වූ නමින් ම පෙනී සිටිය බව ය.

වවුනියා දිස්ත්‍රික්කයේ මහකච්චට්කෝඩියෙන් හමුවන ශිලා ලිපියකින් ද සෙන්පතිවරයකු හඳුනාගැනීමට පුළුවන.*''ශෙනපති පුත පරුමක නදික පුත ....''* (සෙන්පතිගේ පුත් ප්‍රමුඛ නදිකගේ පුත් ...) (IC, (1970), No. 322) පරුමක විරුදය දරන නදික සෙන්පතිවරයාගේ පුතා ලෙස සඳහන් කර ඇති නමුත් සෙන්පතිවරයාගේ සංඥා නාමය කුමක් ද යන්න එහි සඳහන්ව නැත. මෙම ලේඛනයේ එන සෙන්පතිවරයා පරුමකයකු ලෙස හඳුනා ගැනීමට නොහැකි වන නමුත් ඔහුගේ පුතා හා මුණුබුරා පරුමකවරු ලෙස පෙනී සිටිති. එම විරුදය සෙන්පතිවරයාගේ පරම්පරාව භාවිත කිරීමෙන් පෙනී යනුයේ එකල සමාජ සංවිධානය තුළ ප්‍රමුඛ කාර්යභාරයක් ඉට කළ පවුලක් ලෙස ඔවුන්ට විශාල සමාජ පිළිගැනීමක් ලැබෙන්නට ඇති බව ය. මීට අමතරව හම්බන්තොට දිස්ත්‍රික්කයේ ගෝණගලින් හමුවන ශිලා ලේඛනයකින් ද අබය නම් සෙන්පතිවරයකු හඳුනාගැනීමට හැකි ය.*''පරුමක ශෙනපති අබය පුත පරුමක පුශදෙව පුත පරුමක අබයහ ලෙණෙ අගත අනගත චතු දිශ ශගශ දිනෙ''* (ප්‍රමුඛ සෙන්පති අබයගේ පුත් ප්‍රමුඛ වුස්සදේවගේ පුත් ප්‍රමුඛ අබයගේ ලෙන පැමිණි නොපැමිණි සිවු දිශාවේ සංඝයාට දෙන ලදි) (IC, (1970), No. 665) ඉහත සඳහන් කළ ලේඛනයේ දක්නට ලැබෙන සුවිශේෂිත කරුණ වනුයේ සෙන්පති අබයගේ පරම්පරාවේ සියලු දෙනාම 'පරුමක' විරුදය දරා තිබීමයි. එයින් පැහැදිලි වනුයේ ඔහුගේ පරම්පරාව විශාල සමාජ බලයක් සහිතව එකල වාසය කළ බව ය.

වවුනියා දිස්ත්‍රික්කයේ හිට්ටාරගමහින්නෙන් හමුවන අපර බ්‍රාහ්මී යුගයට අයත් ලිපියකින් අසේල නම් සෙන්පතිවරයකු හඳුනා ගැනීමට පුළුවන. *''සෙනපති අසෙලයහ මරුමනක මහරක අබයහ ලෙණෙ....''* (සේනාපති අසේලගේ මුනුබුරා වූ මහරඣ අබයගේ ලෙන ...) (IC, (1970), No. 1161) මෙම ලේඛනය අයත් වන්නේ මහරඣ අබයට ය. ඔහු සෙන්පති අසේලගේ මුනුබුරා ලෙසින් පෙනී සිටියි. මෙහි නම් සඳහන් සෙන්පති අසේල කවර පාලකයකු යටතේ සේවය කළ අයෙක් ද යන්න නිශ්චිතව හඳුනා ගැනීමට අපහසු ය.

ඉහත සඳහන් කළ බ්‍රාහ්මී ශිලා ලේඛනවලින් අනාවරණය කර ගැනීමට හැකි වූ සෙන්පතිවරු අතුරින් දෙදෙනකු හැර අන් සියලු දෙනාම පාහේ පරුමක විරුදය දැරූ පුද්ගලයන් ය. අනෙක් සෙන්පතිවරු දෙදෙනා අතුරින් එක් අයකු පරුමක විරුදය නොදැරුව ද ඔවුන්ගේ පුත්වරු හා මුණුබුරන් පරුමක විරුදය දරමින් සමාජය ඉදිරියේ පෙනී සිටීමෙන් පෙනී යනුයේ රාජ්‍ය සංවිධානයේ ඉහළ ම තනතුරක් වන සෙන්පති තනතුර සඳහා පරුමක විරුදය දරන සමාජ කණ්ඩායම් අතුරෙන් පුද්ගලයන් තෝරාගෙන ඇති බව ය. රාජ්‍ය සංවිධානය ක්‍රමවත්ව සකස්වීමට පෙර සිට ම මේ කියන සමාජ කණ්ඩායම සමාජය හැසිරවීමෙන් හා ඔවුන්ට නායකත්වය දෙමින් කටයුතු කළ නිසාත් ඔවුන්ට පරිපාලනය පිළිබඳ යම් දැනුමක් තිබූ නිසාත් පාලකයන් ඔවුන් අතුරින් සුදුසු අයට සෙන්පති වැනි වැදගත් තනතුරක් ලබා දීමට අවධානය යොමු කරන්නට ඇතැයි කල්පනා කළ හැකි ය.

අමාත්‍යවරු හා ඔවුන්ගේ සමාජ පරිසරය

රථයක චක්‍ර (රෝදය) තවත් චක්‍රයක සහායකින් තොරව ඉදිරියට ගමන් නොකරන්නේ ද එලෙසින් අමාත්‍ය ආදි සහායකයන්ගෙන් තොරව රාජ චක්‍රය ද ඉදිරියට ගමන් කරන්නේ නැත. එනිසා රජු සුදුසු ඇමැතිවරු රාජසභාවට පත් කරගෙන ඔවුන්ගේ අදහස්වලට ඇහුම්කන් දෙමින් රාජ්‍යය පාලනය කළ යුතු බව කෞටිල්‍යගේ අදහසයි.

''සහායසාධ්‍යං රාජත්වං චක්‍රමෙකං න වර්තතෙ - කුර්වීතසචිවාංස්තස්මාත්තෙෂාං ච ශ්‍රෘණුයාන්මතම්'' (අ. ශා., (1-2), (2003), 7: ශ්ලෝක 9) කෞටිල්‍යගේ මෙම ඉගැන්වීම්වලට අනුව පැහැදිලි වනුයේ හුදෙක් පාලකයකුට පමණක් රාජ්‍යයක පාලන කටයුතු මෙහෙයවීම අපහසු බව ය. අමාත්‍යයන්ගේ සහාය නොලබන පාලකයාගේ රාජ්‍යය චක්‍රයන්ගේ සහාය නොලද සැකක් මෙන් ඉදිරියට ගමන් නොකරයි. රාජ්‍ය තන්ත්‍රය තුළ අමාත්‍ය තනතුරට කෙතරම් වැදගත්කමක් හිමිව තිබුණේ ද යන්න මෙයින් අවබෝධ කරගත හැකි ය.

රාජ්‍ය සංවිධානයේ සුවිශේෂිත කාර්යභාරයක් ප්‍රධාන අමාත්‍යවරයාට පැවරී ඇති බැවින් හා ඔහු රජුට පසුව පාලන සංවිධානයේ බලධරයා වන බැවින් එම තනතුරට තෝරාගැනීමේදී අවධානය යොමු කළ යුතු කරුණු ගණනාවක් පවතින බව භාරතීය මූලාශ්‍රය අධ්‍යයනය කිරීමේදී පෙනී යයි. මහාභාරතයට අනුව 'උතුම් රූපය, වර්ණය හා මිහිරි ස්වරයෙන් යුක්ත, ඉවසන සුළු, ඊර්ෂ්‍යා රහිත, උතුම් කුලයක උපන් හා ශීලයෙන්' යුක්ත අයකු වේ නම් ඔහු ප්‍රධාන ඇමැතිවරයා බවට පත්කරගත යුතු ය. *''රූපවර්ණස්වරොපෙතස්තිතික්ෂුරනසූයකඃ - කුලීනඃ ශීලසම්පන්නඃ ස තෙ ස්‍යාත් ප්‍රත්‍යනන්තරඃ''* (ම. භා., (ශාන්ති පර්වය), 80: ශ්ලෝක 21) ප්‍රධාන ඇමැතිවරයා පිළිබඳව තවදුරටත් කරුණු දක්වන මහාභාරතය 'කිසියම් අයෙක් ඥාණවන්ත බවින්, ස්මරණ ශක්තියෙන් යම් කාර්යයක් කිරීමට දක්ෂ වේ ද, ස්වභාවයෙන් ම දයාවන්ත වේ ද, බහුමානයේදී මෙන්ම නින්දාවේදී සිතෙහි ද්වේෂයක් හෝ නරක අදහස් ඇති නොවන, කීර්තිය ප්‍රධාන කොට සලකන, අවස්ථාවට අනුව ක්‍රියා කරන, බලවතුන්ට ද්වේෂය හා අයහපත නොකරන, ඉච්ඡාවන්ට බිය ඇති, ලෝභයට හා ක්‍රෝධයට වසඟ වී ධර්මය අත් නොහරින, කථාවේ චතුර වූ පටුත්වයක් ඇති තැනැත්තා' අගමැති ලෙස හෙවත් ප්‍රධාන ඇමැතිවරයා ලෙස තෝරාගත යුතු යැයි උපදෙස් දී තිබේ.

> *''මෙධාවී ස්මෘතිමාන් දක්ෂඃ ප්‍රකෘත්‍යා චානෘශංස්‍යවාන්*
> *යො මානිතො'මානිතො වා න ච දූෂ්‍යෙත් කදාචන''*
> *''කීර්තිප්‍රධානො යස්තු ස්‍යාද්‍යශ්චස්‍යාත් සමයේ ස්ථිතඃ*
> *සමර්ථාන් යශ්ච න ද්වේෂ්ටි නානර්ථාන් කුරුතෙ ච යඃ''*
> *''යොන කාමාද් භයාල්ලොභාත් ක්‍රෝධාද් වා ධර්මමුත්සෘජෙත්*
> *දක්ෂඃ පර්යාප්තවචනඃ ස තෙ ස්‍යාත් ප්‍රත්‍යනන්තරඃ''*   (ම. භා., (ශාන්ති පර්වය), 80:

ශ්ලෝක 22, 26, 27) ප්‍රධාන අමාත්‍යවරයාගේ චරිත ලක්ෂණ පිළිබඳව තවදුරටත් කරුණු දක්වන මහාභාරතය, කිසියම් මන්ත්‍රිවරයෙක් 'කාම, ලෝභ, බිය හා ක්‍රෝධයෙන් වසඟයට ගොස් ධර්මය පරිත්‍යාග නොකරයිද, යමෙක් සියලු කාර්යයන්හී දක්ෂ හා යථාර්ථවාදී වෙයිද', ඔහු රජුගේ මුඛ්‍ය හෙවත් ප්‍රධාන මන්ත්‍රිවරයා බවට පත්කරගත යුතු යැයි උපදෙස් දී තිබේ. (ම. භා., (ශාන්ති පර්වය), (2006), 81: පි. 230)

අර්ථශාස්ත්‍රයට අනුව 'සිය ජනපදයේ උපන් කුලීන, දුර්ගුණවලින් තොර, ශිල්ප දත්, අර්ථශාස්ත්‍රය උගත්, බුද්ධිමත්, ස්මෘතිමත්, චතුර, කථාවේ දක්ෂ, හුරුබුහුටි, ප්‍රතිභාපූර්ණ, උත්සාහවත්, ප්‍රභාවශීලී, කෙලෙස් ඉවසීමෙහි අසමත්, පිවිතුරු, මිත්‍ර ගුණවලින් යුක්ත, දෘඪ, භක්තිවත්, සිල්වත්, බලයෙන් නීරෝගී බව හා ධෛර්ය සම්පන්න, අහංකාර හා

චපල බවෙන් තොර, ප්‍රිය හා වෛරයෙන් තොර' පුද්ගලයා අගමැති කළ යුතු ය. *''ජානපදොභිජාතඃ සවවනුග්‍රහඃ කෘතශිල්පශිල්පචක්ෂුමාන්ප්‍රාඥො ධාරයිෂ්ණුදීක්ෂො වාග්මී ප්‍රගල්භඃ ප්‍රතිපත්තිමානුත්සාහ ප්‍රභාවයුක්තඃ ... වෛරාණාමකර්තෙත්‍යමාත්‍ය සංපත්''* (අ. ශා., (අධිකාර 1), (2003), 9ඃ ශ්ලෝක 1) තමන්ට පෙර සිටි සියලු ම ආචාර්යවරුන්ගේ අදහස් සැලකිල්ලට ගන්නා කෞටිල්‍ය විසින් ඉහත සඳහන් කළ කරුණුවලට ද අවධානය යොමු කරමින් ප්‍රධාන ඇමැතිවරයා තෝරාගත යුතු යැයි පෙන්වාදී තිබේ. ඉහත සඳහන් කළ සියලු මූලාශ්‍රය, ප්‍රධාන අමාත්‍යවරයා එසේත් නැති නම් අගමැතිවරයා තෝරාගැනීමේදී මනා රූ සපුවක් මෙන්ම, මිහිරි වචන කථා කරන, ඉවසීම ප්‍රගුණ කළ, ක්‍රෝධ විරහිත, ඊර්ෂ්‍යාව බැහැර කළ, සිය නායකයා කෙරෙහි ඇලුණු, උසස් කුලයක උපන් ආදි වශයෙන් සැලකෙන ගුණාංග හා ගතිලක්ෂණවලට අවධානය යොමු කළ යුතු යැයි පැහැදිලි කර තිබේ. ඉහත සඳහන් කළ භාරතීය මූලාශ්‍රය ප්‍රධාන අමාත්‍යවරයා හෙවත් අගමැති තුමා තෝරාගැනීමේ දී අවධානය යොමු කළ යුතු සුදුසුකම් හා ගති ලක්ෂණ කවරේද යන්න පැහැදිලි කර ඇති අතර එම මූලාශ්‍රය තුළ අන්තර්ගත සියලු කරුණු සැලකිල්ලට භාජනය නොකළ නමුත් මෙරට පාලකයන් විසින් සිය ප්‍රධාන අමාත්‍යවරයා තෝරාගැනීමේදී ඉහත සඳහන් කළ ආකාරයට පුද්ගලයන් සතු සුදුසුකම් මෙන්ම ඔවුන් සතු ගතිලක්ෂණ කෙරෙහි ද අවධානය යොමු කරන්නට ඇතැයි කල්පනා කළ හැකි ය.

රිටිගලින් හමුවන බ්‍රාහ්මී ශිලා ලිපි දෙකකින් ම මහාමාත්‍ය තනතුර දැරූ බ්‍රහ්මදත්ත නම් තැනැත්තකු පිළිබඳ තොරතුරු හමුවේ. *''මහමත බමදත පුත පරුමක පුශගුතෙන ...'' ''මහමත බමදත පුත පරුමක බහිකෙ ....''* (IC, (1970), No. 268, 269) ඉහත ශිලා ලේඛන දෙකම අයත් වන්නේ මහාමාත්‍ය බ්‍රහ්මදත්තගේ පුතුන් දෙදෙනා වන ප්‍රමුඛ පුස්සගුත්ත හා ප්‍රමුඛ බහික යන අයට ය. මහාමාත්‍ය බ්‍රහ්මදත්තගේ නමට පූර්වයෙන් පරුමක වැනි විරුද නාමයක් භාවිත කර නැති නමුත් මෙහිදී ඔහුගේ පුතුන් දෙදෙනා ම පරුමකවරු ලෙස පෙනී සිටී. රාජ්‍ය සංවිධානයට සම්බන්ධ උසස් නිලයක් වන අමාත්‍ය තනතුරත් සමාජ සංවිධානය තුළ තමන්ගේ තත්ත්වය හා බලය ප්‍රකට කරන පරුමක බව ශිලා ලේඛන තුළ යෙදීමෙන් එම පවුලට එකල සමාජ සංවිධානය තුළ ලැබුණු පිළිගැනීම කවර මාදිලියේ එකක් ද යන්න අවබෝධ කරගත හැකි ය.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ උද්ධකන්දරින් හමුවන *''ලෙණෙ ශගශ මහමත තිසහ ලෙණෙ ශගශ''* (ලෙන සංඝයාට මහාමාත්‍ය තිස්සගේ ලෙන සංඝයාට) (IC, (1970), No. 702) ශිලා ලිපියකින් ද මහාමාත්‍ය ධූරය දැරූ තිස්ස නම් ඇමැතිවරයකු හඳුනා ගැනීමට පුළුවන. ඉහත සඳහන් කළ බ්‍රහ්මදත්ත මෙන්ම මෙම ශිලා ලිපියේ එන තිස්ස ද මහාමාත්‍යවරයෙකි. රාජ්‍ය පරිපාලන සංවිධානය තුළ රජුට සහාය දක්වන කණ්ඩායම් අතුරින් ප්‍රමුඛ වන්නේ අමාත්‍ය මණ්ඩලයයි. එම අමාත්‍ය මණ්ඩලයේ ප්‍රමුඛයා බවට පත්වීමට ඉහත සඳහන් කළ අග්ගිදත්තට හා තිස්සට හැකි වීමෙන් පෙනී යනුයේ ඔවුන් සුවිශේෂිත හැකියාවන්ගෙන් මෙන්ම යහපත් ගති ලක්ෂණවලින් සන්නද්ධව සිටි බව ය.

පුත්තලම් දිස්ත්‍රික්කයේ පිච්චණ්ඩියාවෙන් හමුවන ශිලා ලිපියකින් *''උපරඣ අමතිහ අය මහශෙනහ''* (උපරජ - අමාත්‍ය මහශෙන කුමරු) (IC, (1970), No. 1064) තවත් අමාත්‍යවරයකු පිළිබඳව තොරතුරු හමුවේ. ලිපියේ සඳහන්ව ඇති ආකාරයට මහාශේන යනු උපරජුගේ අමාත්‍යවරයෙකි. මෙම ලිපියෙන් කියැවෙන උපරජු කවරකු ද යන්න නිශ්චිතව කිව නො හැකි නමුත් මහාශේන ඇමැතිවරයා මෙහිදී නම්කර ඇත්තේ කුමාරයෙක් ලෙසිනි. එයින් පැහැදිලි වනුයේ ඔහු රාජකීය පවුලක් නියෝජනය කරන බව ය. මීට අමතරව අපර බ්‍රාහ්මී අවධියට අයත් දෙමටගලින් හමුවන ශිලා ලිපියක *''සි ( ) අමතය බරයහ උපසක .....''* (IC, (1970), No. 1179) බරය නම් අමාත්‍යවරයෙක් පිළිබඳව මෙන්ම රාගල විහාරයෙන් හමුවන ශිලා ලිපියකින් *''අමතය බඩකරක අහ(ලිය) .....''* (IC, (1970), No. 1192) භාණ්ඩාගාරික තනතුර ද දැරූ අහලිය නම් අමාත්‍යවරයෙක් පිළිබඳව තොරතුරු හමු වේ.

බඩකරික හෙවත් භාණ්ඩාගාරික තනතුරු

''රාඥඃ කොශක්ෂයාදෙව ජායතෙ බලසංක්ෂයඃ'' රාජ්‍ය භාණ්ඩාගාරය කිසියම් ආකාරයකින් විනාශ වන්නේ ද එවිට රජුගේ බලය ද විනාශ වේ. (ම. භා., (ශාන්ති පර්වය), (2006), 131ඃ ශ්ලෝක 12) යන මහාභාරත සඳහනින් පෙන්නුම් කරනුයේ රාජ්‍ය තන්ත්‍රයට භාණ්ඩාගාරය එතරම් ම වැදගත් වන බව ය. යමකු කෙරෙහි 'විනය යුක්ත බුද්ධිය, උතුම් ස්වභාවය, තේජස, ධෛර්‍යය, ඉවසීම, පිවිතුරු බව, අනුරාගය, මර්යාදාව හා ධාරණය' යන මේ සියලු ගුණ විද්‍යමාන වෙයිද, ඒ සියලු ගුණ මැනවින් පරීක්‍ෂා කොට, ප්‍රෞඪත්වයෙන් යුක්ත නම්, කපටි බවෙන් තොර නම් ඔවුන්ගෙන් පස්දෙනකු තෝරාගෙන මුදල් අමාත්‍ය තනතුරට පත් කරගත යුතු ය. (ම. භා., (ශාන්ති පර්වය), (2006), 84ඃ) යන ඉගැන්වීමෙන් ද මහාභාරතය පෙන්වාදීට උත්සාහ කරන්නේ රාජ්‍ය සංවිධානයේ වැදගත් සංස්ථාවක් වන

භාණ්ඩාගාරය ඉහත සඳහන් කළ ගුණධර්ම ඇති අය කෙරෙහි ම තැබිය යුතු යන්නයි. ශුක්‍රාචාර්යන්ට අනුව අයවැය පිළිබඳව මනාව දන්නා 'සුමන්ත්‍ර' නම් වන අතර ඔහුට භාණ්ඩාගාරය භාරදිය යුතු ය. (ශු. නී., (1952), 2: ශ්ලෝක 85) ඔහුට අනුව ඉඳුරන් දිනූ, ධනවත්, ව්‍යවහාරය දත්, ධනය ම ප්‍රාණය කොට ඇති අතිශයින් මසුරු පුද්ගලයකු ම භාණ්ඩාගාරයේ අධ්‍යක්‍ෂක තනතුරට පත් කළ යුතු ය. *''... දාංතස්තුසධනොයස්තු ව්‍යවහාර විශාරදඃ - ධනප්‍රාප්ණොති කෘපණඃ කොශාධ්‍යක්ෂඃ සඑවහි''* (ශු. නී., (1952), 2: ශ්ලෝක 151)

ශුක්‍රාචාර්යයන්ට වඩා ප්‍රතිවිරුද්ධ අදහසක් දරන භීෂ්ම ලොල් වූවන් හා මෝඩ පුද්ගලයන් අර්ථ කාර්‍යයන්හී නොයෙදිය යුතු යැයි සඳහන් කරයි. (ම. භා., (ශාන්ති පර්වය), 71: ශ්ලෝක 8, 9) කිසියම් අයෙක් ලෝභත්වයෙන් තොරද බුද්ධිමත් ද ඉදින් ඔවුන් අර්ථ කාර්‍යයේ යෙදවිය යුතු ය. මෝඩ තැනැත්තන් ධනය සංග්‍රහ කිරීමට යෙදවුවහොත් ඔහු අනුචිත උපායවලින් ප්‍රජාවට කරදර කරනු ඇත. එසේ හෙයින් එවැන්නන් තත් කාර්‍යයන්හී නොයෙදීමට රජු වගබලා ගත යුතු ය. භාණ්ඩාගාර අධ්‍යක්‍ෂක පිළිබඳව කරුණු දක්වන කෞටිල්‍ය පිටතින් හා ඇතුළතින් ලැබෙන ආදායම පිළිබඳව මනාව දත් අයකු එම තනතුරේ පිහිටුවිය යුතු යැයි සඳහන් කර ඇත. වර්ෂ සියයකට පෙර ආදායම පිළිබඳව විමසුවහොත් ඒ පිළිබඳව ද තත්කාලයේ ගණන් පිළිබඳව ද ස්මරණ ශක්තිය ඔහුට තිබිය යුතු ය. එසේ ම ගණන් හිලවු පැහැදිලිව ලේඛනගත කිරීමේ හැකියාව ද ඔහුට තිබිය යුතු ය. (අ. ශා., (අධිකාර 2), (2003), 5: පි. 146) මුදල් පරිහරණයේදී සිදුවන වංචනික ක්‍රියාවන් වැළැක්වීම සඳහා ඉහත සඳහන් කළ ගුණාංගවලින් පිරිපුන් නිලධාරීන් පත්කර ගැනීම අවශ්‍ය බව මෙයින් පැහැදිලි වන අතර රජුගේ පැවැත්මත් රාජ්‍ය භාණ්ඩාගාරයත් ඒ මත රඳා පවතින බවත් මෙයින් පෙන්වාදිය හැකි ය.

බ්‍රාහ්මී ශිලා ලේඛනවල පෙනී සිටින බඩකරික < භාණ්ඩාගාරික යනු බඩු - මුදල් ආදිය බාරව සිටි නිලධරයෙකි. මුල් අවධියේ ඇමැතිවරු ද මෙම නිලය දරා තිබේ. ඔවුන්ට ද භාණ්ඩාගාරිකයන් සිටි බව පැවසේ. නමුත් මේ තත්ත්වය පසුකාලීනව වෙනස් වී එම නිලය භාණ්ඩාගාරය නමැති රාජකීය සංස්ථාවෙහි ප්‍රධානියා හා අයබදු එකතු කරන සංවිධානයෙහි ප්‍රධානියා (භඩකරික) නමින් හැඳින්වීමට පෙළඹී තිබේ. (අමරවංශ හිමි, (1969), පි. 90) රාජ්‍ය සංවිධානයට අයත් ප්‍රධාන නිලයක් වන භාණ්ඩාගාරික තනතුරු හෙබ වූ කිහිප දෙනකු ම බ්‍රාහ්මී ශිලා ලේඛනවලින් හඳුනා ගැනීමට හැකි වන අතර එම ලේඛන අනුසාරයෙන් ඔවුන්ගේ සමාජ තත්ත්වයත් ක්‍රියාකාරිත්වයත් මෙයින් විමසා බැලේ.

''බඩකරික පරුමක තිශ පුත පරුමක අසඩ ගුතහ ලෙණෙ'' (භාණ්ඩාගාරික ප්‍රමුඛ තිස්සගේ පුත් ප්‍රමුඛ අසඩගුත්තගේ ලෙන) යනුවෙන් මිහින්තලෙන් හමුවන බ්‍රාහ්මී ශිලා ලේඛනයක භාණ්ඩාගාරික තනතුර දැරූ තිස්ස නම් තැනැත්තෙක්ව හඳුනා ගැනීමට හැකියාව පවතී. (IC, (1970), No. 3) මෙම ශිලා ලේඛනයෙන් කියැවෙන තිස්ස රාජ්‍ය තන්ත්‍රයට අයත් භාණ්ඩාගාරික තනතුර හොබවා ඇත. මෙම ලේඛනයේ නම් සඳහන් භාණ්ඩාගාරික තිස්සත් ඔහුගේ පුත්‍රයා වන අසඩගුත්තත් යන දෙදෙනා ම පරුමක විරුදය දරමින් පෙනී සිටින බැවින් එකල සමාජ සංවිධානය තුළ ඔවුන්ට හිමිව පැවති සමාජ තත්ත්වයත් ඔවුන්ගේ හැකියාවත් හඳුනාගත හැකි ය.

''බඩකරි(ක පරු)මක තිශපුත බඩකරික පරුමක මගහ ලෙණෙ ශගශ'' (භාණ්ඩාගාරික ප්‍රමුඛ තිස්සගේ පුත් භාණ්ඩාගාරික ප්‍රමුඛ මගගේ ලෙන සංඝයාට) (IC, (1970), No. 22) මිහින්තලෙන් හමුවන මෙම ලිපියෙන් ද භාණ්ඩාගාරික වෘත්තියේ යෙදී සිටි පරුමක විරුදය දරන තිස්ස හා මග නමින් පෙනී සිටින පිය පුතු දෙදෙනකු හඳුනා ගැනීමට හැකියාව පවතී. ඉහත ලේඛනයේ නම් සඳහන් තිස්සත් මෙම ලේඛනයේ නම් සඳහන් තිස්සත් දෙදෙනකු නොව එක් අයකු ම විය හැකි ය. මෙම ලේඛනය සුවිශේෂිත වනුයේ මෙහි එන තිස්ස හා මග යන පිය පුතු දෙදෙනා ම භාණ්ඩාගාරික තනතුර දරා තිබීමයි. මෙම ලේඛනයට අවධානය යොමු කරන විට භාණ්ඩාගාරික තනතුර පිය පුතු පරම්පරාවෙන් හිමි වන එකක් යැයි හැඟී ගිය ද එය එසේ පරම්පරාවෙන් උරුම වන තනතුරක් නොවන බව සිහිතබාගත යුතු ය.

''බඩගරික ගමික අනුඩිය ඣිත උපශිකා තිශය ලෙණෙ ශගශ'' (භාණ්ඩාගාරික ගමික අනුඩියගේ දියණිය වූ උපාසිකා තිස්සාවගේ ලෙන සංඝයාට) (IC, (1970), No. 39) මිහින්තලෙන් ම හමුවන මෙම ලෙන් ලිපියෙන් ද අනුඩිය නම් භාණ්ඩාගාරිකයකු හඳුනා ගැනීමට හැකියාව පවතී. අනුඩිය භාණ්ඩාගාරික නිලයෙන් මෙන්ම 'ගමිකයකු' ලෙස ද පෙනී සිටීමෙන් පැහැදිලි වනුයේ ඔහු ගමට නායකත්වය දුන් රාජ්‍ය පාලන සංවිධානය ඍජුව සම්බන්ධතා දැක් වූ අයකු බව ය. "Gāmika was the governor of a village, or overseer of a township of parish" (IC, (1970), p. Ixxxvii) ගමිකයා යනු කවරෙක් ද යන්න මෙයින් හඳුනාගත හැකි ය. මෙම නිලය හා නාමය සම්බන්ධයෙන්

අදහසක් කොත්මලේ අමරවංශ හිමියන් විසින් ද ඉදිරිපත් කර තිබේ. උන්වහන්සේ පෙන්වා දෙන ආකාරයට පැරණි පාලන සංවිධානයට අනුව 'ගම' යන්නෙන් වෙසෙසනු ලැබූ කොටසේ ප්‍රධානියා යි. එය නිලනාමයකි. පරපුරෙන් පරපුරට ලැබෙන පදවියකි. ඇතැම් ගමිකයන්ගේ පියවරුන් ද, පියාගේ පියවරුන් ද ගමිකයන් වූ බව එවැනි පරපුර සඳහන් ලිපිවලින් පෙණේ. ඇතැම් ගමිකවරු ඇමති පදවි දැරූ බවත්, ඇතැම් ගමිකයන්ට භාණ්ඩාගාරිකයකු සිටි බවත්, සෙල්ලිපිවල ම සදහන්ව ඇති හෙයින් එය වැදගත් තනතුරකැයි ද කියති. (අමරවංශ හිමි, (1969), පි. 93)

''පරුමක සෙනපුත බඩකරික පරුමක සෙනහ ලෙණෙ සගස'' (ප්‍රමුඛ සේනගේ පුත් භාණ්ඩාගාරික ප්‍රමුක සේනගේ ලෙන සංඝයාට) (IC, (1970), No. 59) මිහින්තලේ රාජගිරිකන්දෙන් හමුවන මෙම ලෙන් ලිපියෙන් සේන නම් භාණ්ඩාගාරිකයකු පිළිබඳ තොරතුරු හමුවේ. භාණ්ඩාගාරික තනතුර දරන සේන මෙන්ම ඔහුගේ පියා ද මෙහිදී පරුමක විරුදය ද දැරීම සුවිශේෂිත තත්ත්වයකි. පිය පුතු දෙදෙනාගේ ම නම් සඳහන් වන්නේ සේන නමිනි. මෙම ලිපිය හැරුණු කොට භාණ්ඩාගාරික සේන පිළිබඳව *''බඩකරික පරුමක සෙනහ ලෙණෙ සගස''* (භාණ්ඩාගාරික ප්‍රමුඛ සේනගේ ලෙන සංඝයාට) (IC, (1970), No. 63) මෙම ලෙන සේන විසින් ම සංඝයා වහන්සේට පූජා කරන ලද්දකි. *''බඩකරික පරුමක සෙනහ බරියා උපාසිකා සුමන (ය) ලෙණෙ සගස''* (භාණ්ඩාගාරික ප්‍රමුඛ සේනගේ භාර්යාව වූ සුමනාගේ ලෙස සංඝයාට) (IC, (1970), No. 64) මෙම ලෙන භාණ්ඩාගාරික සේනගේ භාර්යාව වූ සුමනා විසින් සංඝයා වහන්සේට පූජා කරන ලද්දකි. මෙම ලේඛන එක ම ස්ථානයකින් හමුවන බැවින් භාණ්ඩාගාරික තනතුර දරමින් පෙනී සිටින සේන එක් අයකු ම ලෙස පිළිගැනීමට පුළුවන.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ සිතුල්පව්වේ කොරවක්ගලින් හමුවන ශිලා ලිපියකින් භාණ්ඩාගාරික තනතුරු දැරූ *''පිත මහරඣහ බඩකරික පරුමක ශුමන පුත ......''* (IC, (1970), No. 621) ශුමන නම් අයකු හඳුනාගත හැකි ය. මෙම ශිලා ලිපියෙන් අනාවරණය වන ප්‍රමුඛ ශුමන කවර පාලකයකු යටතේ සේවය කළේද යන්න පැහැදිලි ලෙසින් මෙහි සඳහන් කර ඇත. මෙහි නම් සඳහන් 'පිත මහරජ' වෙන කවරෙකුවත් නොව සිය සහෝදරයාගේ මරණයෙන් පසුව ඔහු පුත් මහාචූලික කුමරා හදාවඩාගත් වළගම්බා රජු ය. *''.....පිතිට්ඨානෙ ඨිතතා'ස්ස පිතිරාජා චබ්බුං''* (ඌ.පූ.ම, (1959), 33ඃ ගාථා. 35, 36) ඉහත ලිපියට ආසන්නයේ ම වූ තවත් ලිපියකින් *''පරුමක මිත පුත බඩකරික දතහ''* (IC, (1970), No. 629) දත්ත නම් භාණ්ඩාගාරිකයකු හඳුනා ගැනීමට පුළුවන. භාණ්ඩාගාරික දත්ත පරුමකයකු ලෙස පෙනී නොසිටිය ද ඔහුගේ පියා පරුමකයකු ලෙස පෙනී සිටීමෙන් පෙනී යනුයේ එම පවුලට ද එකල සමාජ සංවිධානය තුළ හිමිව තිබූ තත්ත්වයයි.

රිටිගල ආඬියකන්දෙන් හමුවන *''බඩකරික මජිමහ ලෙණෙ...''* (භාණ්ඩාගාරික මජ්ඣිමගේ ලෙන) (IC, (1970), No. 245) මෙම ලෙන් ලිපියේ එන මජ්ඣිම ද, පොළොන්නරුවේ කන්දේගමකන්දෙන් හමුවන *''පරුමක බඩිහර මිත පුත පරුමක බමණ උතිය ලෙණෙ ....''* (ප්‍රමුඛ භාණ්ඩාගාරික මිත්තගේ පුත් ප්‍රමුඛ බ්‍රාහ්මණ උත්තියගේ ලෙන) (IC, (1970), No. 296) මෙම ලෙන් ලිපියේ එන මිත්ත ද, කුරුණෑගල දිස්ත්‍රික්කයේ නුවරකන්දෙන් හමුවන *''ගමික කණතිශහ බඩකරික අනුරදහ ලෙණෙ''* (ගමික කණතිස්සගේ හා භාණ්ඩාගාරික අනුරුද්ධගේ ලෙන) (IC, (1970), No. 916) යන මෙම ලිපියේ නම් සඳහන් අනුරුද්ධ ද (ඔහු ගමික විරුදය දැරූ අයෙකි), කුරුණෑගල තෝරව මයිල්ලෑව නම් ස්ථානයෙන් හමුවන *''මහරඣහ පණිත බඩකරික පරුමක ශුමනහ''* (මහරජුගේ භාණ්ඩාගාරික ප්‍රමුඛ ශුමන) (IC, (1970), No. 1035) මෙම ලිපියේ එන ශුමන ද භාණ්ඩාගාරිකයන් ලෙස හඳුනාගත හැකි ය.

මීට අමතරව අපර බ්‍රාහ්මී අක්ෂරවලින් ලියා ඇති මිහින්තලෙන් හමුවන ලිපි දෙකකින් *''බඩකරික පරුමක සගහ පුත ....''* (භාණ්ඩාගාරික ප්‍රමුඛ සගගේ පුත් ...) *''සිධ බඩකරික සගහ පුත උතිය...''* (යහපතක් වේවා. භාණ්ඩාගාරික සගගේ පුත් උත්තියගේ ...) (IC, (1970), No. 1109, 1110) පරුමක විරුදය දරන සග නම් අයකු ද, රාගල විහාරයෙන් හමුවන *''අමතය බඩකරක අහ(ලිය) .....''* (අමාත්‍ය භාණ්ඩාගාරික අහලිය ...) (IC, (1970), No. 1183) මෙම ලිපියෙන් අමාත්‍ය ධූරයක් දරන අහලිය නම් අයකු ද භාණ්ඩාගාරික වෘත්තියේ නියැලී සිටි බවට හඳුනාගත හැකි ය.

ඉහත සඳහන් කරන ලද භාණ්ඩාගාරික තනතුර දරන අය අතුරෙන් තිදෙනකු හැර අන් සියලු දෙනා ම පරුමක විරුදය දරන කණ්ඩායම අතුරෙන් එම තනතුරට පත් වූ අයයි. එසේ නොවන තිදෙනා අතුරෙන් එක් අයකු ගමණි විරුදය දැරූ ගම් ප්‍රධානියෙකි. ඉහත සඳහන් කළ අවසන් ලිපියේ නම් සඳහන් අහලිය අමාත්‍යවරයකි. ඒ හැරුණු කොට ඔහු වෙනත් විරුදයක් භාවිත කර නැත. රිටිගල ආඬියාකන්දෙන් හමුවන භාණ්ඩාගාරික මජ්ඣිම පමණක්

කිසිදු විරුදයක් නොදැරූ අයෙකි. මෙම විස්තරවලින් පැහැදිලි වනුයේ රාජ්‍ය සංවිධානයේ ජීවිය හා සමාන භාණ්ඩාගාරයේ ප්‍රධානියා පැරණි සමාජ සංවිධානයේ ඉහළ ම ස්ථරයක් නියෝජනය කළ පරුමකවරු අතුරින් තේරීපත්ව ඇති බව ය. එම සමාජ කණ්ඩායම අතුරින් ම භාණ්ඩාගාරික තනතුරට තෝරාගන්නට ඇත්තේ පරුමකවරුන්ට මුදල් පාලනය සම්බන්ධයෙන් දැනුමක් පැවතී නිසා විය යුතු ය. පරුමකවරු පැරණි සමාජ සංවිධානයේ ඉඩම් හිමියන් ලෙසත් අයබදු එකතු කරන අය ලෙසත් හඳුනාගැනීම තුළින් ඉහත කරුණට සාක්ෂි සපයාගත හැකි ය.

ගණන් (ගණක) පරීක්ෂකවරු

රාජ්‍යය භාණ්ඩාගාරයකින් හෝ කිසියම් ආයතනයකින් හෝ විවිධ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කරනු ලබන විය හියදම් හා ශේෂයන් කවරේද යන්න වාර්ෂිකව හෝ අර්ධ වාර්ෂිකව කිසියම් විගණනයක් සිදු කරනු ලබයි. එම කාර්යය වර්තමානයේ නම් විගණන දෙපාර්තමේන්තුවෙන් හෝ ආයතනයකට අනුබද්ධ කාර්යාංශයක් මගින් සිදු කරයි. අතීතයත් වර්තමානයත් අතර එම කාර්යය සිදු කිරීමේ ක්‍රියාපටිපාටියේ යම් යම් වෙනස්කම් දක්නට ලැබුණ ද එයින් සිදුවන කාර්යය එකක් ම බව පෙනී යයි. පැරණි ශ්‍රී ලංකාවේ තත් කාර්යය සිදු කිරීම සඳහා 'ගණන්' පරීක්ෂකවරයෙක් යොදාගත් බවට සාධක බ්‍රාහ්මී ශිලා ලේඛන ඇසුරෙන් හඳුනාගත හැකි ය.

අනුරාධපුරයේ මහ ඇලගමුවෙන් හමුවන *''ගණක චලි තිශ පුත පරුමක තිශහ..''* (ගණක චලි තිස්සගේ පුත් ප්‍රමුඛ තිස්සගේ ...) (IC, (1970), No. 212) මෙම ලිපියේ නම් සඳහන් චලි තිස්ස ගණන් පරීක්ෂකවරයෙකි. ඔහුගේ පුතා පරුමකවරයකි. ලෙන අයත් වන්නේ ප්‍රමුඛ තිස්සට ය. නැගෙනහිර පළාතේ මියුගුණ වෙහෙරෙන් හමුවන *''ශගශ අශ ඣිතහ ච මහගණක වහලිය ච ලෙණෙ''* (අසගේ දියණියගේ ද මහගණක වහලියගේ ද ලෙන සංඝයාට) (IC, (1970), No. 419) මෙම ලෙන් ලිපියෙන් 'මහගණික' හෙවත් ප්‍රධාන ගණන් පරීක්ෂකවරයකු වූ වහලිය නම් තැනැත්තකු හඳුනාගත හැකි ය. දැනට හමු වී ඇති ශිලා ලේඛන ඇතුරෙන් ප්‍රධාන ගණන් පරීක්ෂකවරයකු හමුවන එක ම අවස්ථාව මෙය සැලකිය හැකි ය.

හම්බන්තොට දිස්ත්‍රික්කයේ මණ්ඩගලින් හමුවන *''ගමික ශතක පුත ගණක - නගය ඣිතය දරක ලෙණෙ ...''* (ගමික ශතකගේ පුත් ගණක නාගගේ දියණිය දරකගේ ලෙන ...) (IC, (1970), No. 576) මෙම ලෙන් ලිපියේ එන නාග ද, මණ්ඩගලින් ම හමුවන *''ගණක රොහකශ ලෙණෙ .....''* ගණක රෝහකශගේ ලෙන ...) (IC, (1970), No. 580) මෙම ලේඛනයේ නම් සඳහන් රෝහකශ ද, සිතුල්පව්වෙන් හමුවන *''පශණදරිය ගමශි ගණක තිශ පුත ගණක තිශහ ලෙණෙ''* (පශණදරිය නම් ගමෙහි ගණක තිස්සගේ පුත් ගණක තිස්සගේ ලෙන) (IC, (1970), No. 619) මෙම ලිපියේ එන තිස්ස නම් පිය පුතු දෙදෙනා ද ගණන් පරීක්ෂකවරු ලෙසින් හඳුනාගත හැකි ය. පිය පුතු දෙදෙනා ම ගණක වෘත්තියේ නියැලී සිටි බවට සාධක හමුවන එක ම ශිලා ලිපිය මෙයයි.

මීට අමතරව හම්බන්තොට දිස්ත්‍රික්කයේ මඟුල්මහා විහාරයෙන් හමුවන *''ගපති ගණකශ වෙමරුකන ...''* (ගෘහපති ගණක වෙමරුකනගේ ...) (IC, (1970), No. 679) මෙම ලිපියේ එන වෙමරුකන ද, හම්බන්තොට දිස්ත්‍රික්කයේ ම වැලඑල්ලූගොඩකන්දෙන් හමුවන *''චලෙ ගණක ..... චලෙ තිශහ ච ලෙණෙ''* (ගණක චල තිස්සගේ ලෙන) (IC, (1970), No. 729) මෙම ලිපියේ එන චල ද, හම්බන්තොට දිස්ත්‍රික්කයේ සීලවකන්දෙන් හමුවන *''ගණක රකිය උපශික ..... ''* (IC, (1970), No. 673) මෙම ලිපියේ එන රකිය ද, පුත්තලම් දිස්ත්‍රික්කයේ මුල්ලේගමින් හමුවන *''උපසක ගණක බලහ ලෙණෙ''* (IC, (1970), No. 1070) මෙම ලිපියේ එන උපාසක බල ද ගණන් පරීක්ෂකවරු ලෙස හඳුනාගත හැකි ය.

මධ්‍යම පළාතේ දමෙඩ ඔයෙන් හමු වන *''මචුඩික රඣශ මණිකරගෙ ශිල ඉටික කටය ....''* (IC, (1970), No. 830) යන මෙම ලිපියෙන් උළු හෝ ගඩොල් කර්මාන්තය ආශ්‍රිතව ගණන් තබන කාර්යයේ නියුතු අයකු පිළිබඳ තොරතුරු හමුවේ. මෙම නිලධරයා මචුඩික රජු යටතේ ක්‍රියා කළ නිලධරයකු බව ලේඛනයේ එන විස්තරයෙන් තහවුරු වේ. මෙම ලේඛනයේ එන මචුඩික රජු යනු එකල සිටි ස්වාධීන පාලකයකි. ගණන් පරීක්ෂක වෘත්තියේ නියැලී සිටි අය තමන් කවරකු යටතේ සේවය කළේ ද යන්න සඳහන් කර නොතිබීම විශාල අඩුපාඩුවකි. ඇතැම් විටෙක මොවුන් රාජ්‍ය සංවිධානයට සම්බන්ධව ද ඇතැම් විටෙක පෞද්ගලික ආයතනවලට සම්බන්ධව ද කටයුතු කරන්නට ඇතැයි කල්පනා කළ හැකි ය. බ්‍රාහ්මී ශිලා ලේඛනවලින් හඳුනා ගැනීමට හැකිවන ගණන් පරීක්ෂකවරු කිසිවෙක් පරුමක හෝ ගමික යන විරුදය දරා නැත. ගණන් පරීක්ෂක චලිගේ පුතා පමණක් පරුමකයකු ලෙස පෙනී සිටී. ගමිකයකු ලෙස පෙනී සිටිනේනේ මණ්ඩගල ශිලා ලිපියේ එන ගණන් පරීක්ෂක නාගගේ පියා වන ශතක පමණි. අනෙක් අය

අතුරින් එක් අයකු ගපතියකු (ගෘහපතියකු) වන අතර තවත් අයෙක් උපාසකයෙක් ලෙස හඳුනාගත හැකි ය. අනෙක් අය එකල ජනප්‍රියව පැවති කිසිදු විරුදයක් දරන බවක් පෙනෙන්නට නැත. මෙයින් පැහැදිලි වනුයේ ගණන් පරීක්ෂක තනතුර සඳහා සමාජ පරිසරයට වඩා හැකියාවට මූලිකත්වය දී කටයුතු කරන්නට ඇති බව ය. එනිසා ගණන් ශාස්ත්‍රය පිළිබඳව හැකියාව ඇති ඕනෑම සමාජ කණ්ඩායමක අයෙකුට එම තනතුරට පත්වීමට හැකියාවක් තිබෙන්නට ඇතැයි මෙයින් කල්පනා කළ හැකි ය.

ආදායම් නිලධාරීන්

රාජ්‍ය නමැති ආයතනයට ලැබිය යුතු සියලු ආදායම් පිළිබඳව කටයුතු කිරීමේ වගකීම පැවරී ඇත්තේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ය. එම දෙපාර්තමේන්තුවේ තත් කාර්යයෙහි නියුතු නිලය ද රාජ්‍ය නමැති ආයතනයට අතිශයින් වැදගත් වූ නිල පද්ධතියක් ලෙස සැලකිය හැකි ය. නූතන රාජ්‍ය තන්ත්‍රය තුළ මෙන්ම අතීත ශ්‍රී ලාංකේය රාජ්‍ය තන්ත්‍රය තුළ ද රාජ්‍ය ආදායම් එකතු කර ගැනීම් ආදි කාර්යයන් සිදු කිරීම සඳහා නිලධර පන්තියක් සිටි බවට තොරතුරු හමු වේ.

නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කයේ රජගලින් හමුවන *''අබය මහරඣහ අයක ගමික අබයහ පුත ගමික .....''* (මහරජ අබයගේ අයකැමි ගමික අබයගේ පුත් ගමික ...) (IC, (1970), No. 429) යන මෙම ලෙන් ලිපියෙන් අබය නමින් හැඳින්වෙන ආදායම් නිලධාරියකු හඳුනා ගැනීමට පුළුවන. ලේඛනයේ නම් සඳහන් ආදායම් නිලධාරී අබය නිශ්චිත වශයෙන් ම අබය මහරජුගේ ආදායම් නිලධාරියා ලෙස පෙනී සිටී. ඔහු ගමිකයකු ලෙස ද පෙනී සිටීමෙන් පැහැදිලි වනුයේ එකල සමාජ පරිසරය තුළ විශාල බලයක් හා තත්ත්වයක් සහිතව සිටි බව ය. මෙහි නම් සඳහන් මහරජ අබය නිශ්චිතව ම හඳුනාගත නොහැකි නමුත් බොහෝ විට ඔහු දුට්ඨගාමණී අබය මහ රජු විය හැකි ය.

නැගෙනහිර පළාතේ ගල්ඔය නිම්නයේ මල්වත්ත නම් ස්ථානයෙන් හමුවන *''චිත දෙවිය අයක පරුමක උති පුත පරුමක සුඣතශ ...''* (චිත්‍රා දේවියගේ අයකැමි ප්‍රමුඛ උත්තියගේ පුත් ප්‍රමුඛ සුඣශගේ ...) (IC, (1970), No. 471) මෙම ලිපියෙන් පරුමක විරුදය දැරූ උති නම් ආදායම් නිලධරයෙක් ගැන කියැවේ. මෙම ආදායම් නිලධාරියා චිත දේවියගේ ආදායම් නිලධරයා ය. චිත්තා දේවිය යනු ගල්ඔය නිම්නයේ මල්වත්ත ප්‍රදේශයට කේන්ද්‍රගතව සිටි ස්වාධීන දේශපාලන චරිතයක් ලෙසින් හඳුනාගත හැකි ය. හම්බන්තොට දිස්ත්‍රික්කයේ තිස්සමහාරාමයෙන් හමුවන *''මහරඣශ අයක පරුමක පුශදෙවහ ...''* (මහරජුගේ අයකැමි ප්‍රමුඛ පුස්සදේවගේ ...'' (IC, (1970), No. 703) මෙම ලිපියෙන් පරුමක විරුදය දැරූ පුස්සදේව නම් ආදායම් නිලධාරියෙක්ව හඳුනාගැනීමට හැකි වේ. ඔහු මහරජුගේ අයකැමියා ලෙස පෙනී සිටිය ද එම මහ රජු කවරෙකු ද යන්න හඳුනාගත නො හැකි නමුත් ඔහු අනුරාධපුර රාජධානියේ ප්‍රධාන පාලකයා ලෙස හඳුනා ගැනීමට හැකියාව ලැබෙනුයේ 'මහරඣ' යන විරුදය දරන බැවිනි.

සිතුල්පව්ව දෙකුන්දරවැව නම් ස්ථානයෙන් හමු වන *''පරුමක වෙලුශුමනශ පුත පරුමක පුශදෙවශ ලෙණෙ දෙවනපියශ රඣ තිශශ අයකශ ලෙණෙ ...''* (ප්‍රමුඛ වේලුශුමනගේ පුත් ප්‍රමුඛ පුස්සදේවගේ ලෙන දෙවනපිය තිස්ස රජුගේ අයකැමිගේ ලෙන ...) (IC, (1970), No. 647) මෙම ලිපියෙන් ද ආදායම් නිලධාරියෙක්ව හඳුනාගැනීමට පුළුවන. මෙම අයකැමියා දෙවනපිය තිස්ස රජුගේ අයකැමියා ලෙස හඳුන්වා තිබීමෙන් එම පාලකයා ද අනුරාධපුර රජ පවුලට සම්බන්ධ අයකු ලෙසින් හඳුනාගත හැකි ය. ඌව පළාතේ බලහුරුකන්දෙන් හමුවන *''අබි උපලය අයක පරුමක ශුමන ...''* (උප්පලා කුමරියගේ අයකැමි ප්‍රමුඛ ශුමන ...) (IC, (1970), No. 761) මෙම ලෙන් ලිපියේ එන ශුමුන ද ආදායම් නිලධාරියෙකි. ඔහු උප්පලා කුමරියගේ අයකැමියා ය. ඇය බලහුරුකන්ද ආශ්‍රිතව සිටි ස්වාධීන රජ පවුලකට අයත් තැනැත්තියක් ලෙස හඳුනාගත හැකි ය. මීට අමතරව කුරුණෑගල හිපවුව නම් ස්ථානයෙන් හමුවන *''උතිය අයක පරුමක නග කුලහ ...''* (උත්තියගේ අයකැමි ප්‍රමුඛ නාගගේ පවුල ...) (IC, (1970), No. 958) යන මෙම ලිපියෙන් ද පරුමක විරුදය දරන නාග නමින් පෙනී සිටින අයකැමියෙක්ව හඳුනා ගැනීමට පුළුවන.

ඉහත සඳහන් කළ බ්‍රාහ්මී ශිලා ලේඛනවලින් අනාවරණය වන ආදායම් නිලධාරීන් අතුරෙන් එක් අයකු හැර අන් සියලු දෙනා ම පාහේ පරුමක හා ගමික යන විරුද දරන සමාජ කණ්ඩායම් අතුරින් තේරීපත් වූ අයයි. මේ විරුද එකක්වත් නොදරන දෙවනපිය තිස්ස රජුගේ අයකැමියාගේ පවුලේ අනෙක් පිරිස පරුමක විරුදය දරන පිරිසකි. මෙයින් පැහැදිලි වනුයේ ආදායම් නිලධාරීන් යනු ඒ ක්ෂේත්‍රය පිළිබඳව පළපුරුද්ද ඇති කණ්ඩායම් අතුරින් තෝරාපත් කරගන්නට ඇති බව ය.

කෝෂ්ඨාගාරිකයෝ හෙවත් ගබඩා පාලකයෝ

අනුරාධපුර දිස්ත්‍රික්කයේ මහ ඇලගමුවෙන් හමුවන පහත සඳහන් ලිපි ත්‍රිත්වයෙන් උතර නම් තැනැත්තෙක් ද, තවත් ලිපියකින් චලු නම් තැනැත්තෙක් ද, තවත් ලිපියකින් උතුර නම් තැනැත්තෙක් ද හඳුනා ගැනීමට හැකියාව ලැබෙන අතර ඔවුන් තිදෙනා ම කෝෂ්ඨාගාරික වෘත්තියේ (ගබඩාපාලකවරු ලෙස) නියැලී සිටි නිලධාරීන් ය. *''වෙශ තෙරශ ච කොටගරික - උතරහ ච ලෙණෙ ශගශ''*(වේශ තෙරුන්ගේ ද කෝෂ්ඨාගාරික උතරගේ ද ලෙන සංඝයාට) (IC, (1970), No. 214) *''වෙශ තෙරශ ච ගපති වුඩ ශිව පුත කොටගරික චලුහ ච ලෙණෙ ශගශ''* (වේශ තෙරුන්ගේ ද ගෘහපති වුඩ ශිවගේ පුත් කෝෂඨාගාරික චලුගේ ද ලෙන සංඝයාට) (IC, (1970), No. 215) *''පුශ තෙරහ ච කොටගරික - උතරහ ලෙණෙ ශගශ''* (පුස්ස තෙරුන්ගේ ද කෝෂඨාගාරික උතරගේ ද ලෙන සංඝයාට) (IC, (1970), No. 226)

පළමු ශිලා ලේඛන දෙකෙන් හඳුනාගනු ලබන 'උතර හා චලු' යන දෙදෙනා ඉහත ලෙන් පූජා කර ඇත්තේ වේශ නම් තෙරුන් වහන්සේ සමඟ ය. අවසන් ලේඛනයේ එන ගබඩාපාලක උතර ද මෙම ලෙන පූජා කර ඇත්තේ පුස්ස තෙරුන් සමඟ ය. භික්ෂූන් වහන්සේ ගිහියන් සමඟ මේ ආකාරයෙන් ලෙන් සකස් කරන්නට ඇත්තේ ඔවුනොවුන් අතර වූ සමීප පවුල් සබඳතාවන් නිසා විය යුතු ය. එසේත් නැති නම් ඔවුනොවුන් අතර පැවති මිත්‍රත්වය මත මේ ආකාරයෙන් ලෙන් සකස්කිරීම සඳහා ධනය යෙදවීම් සිදුකරන්නට ඇත. ඉහත ශිලා ලේඛනවලින් කියැවෙන ගබඩා පාලකයන් රාජ්‍ය තන්ත්‍රයට සම්බන්ධව කටයුතු කළ පිරිසක් ද එසේත් නොවේ නම් පෞද්ගලික අංශයට හෝ ආයතනයකට සම්බන්ධව කටයුතු කළ පිරිසක් ද යන්න නිශ්චිතව හඳුනා ගැනීමට අපහසු ය.

නිගමනය

පූර්ව හා අපර බ්‍රාහ්මී ශිලා ලේඛන මූලාශ්‍රයට අනුව පැරණි ශ්‍රී ලාංකේය රාජ්‍ය තන්ත්‍රය තුළ බහුවිධ වෘත්තීන් රැසක් පැවැති බව පෙනී යයි. එම වෘත්තීන්වල පරුමක, ගමික ආදි සමකාලීන ජන ප්‍රධානීන් මෙන්ම ගපති, උපාසක හා කිසිදු ආකාරයක විරුදයක් නොදරන පුද්ගලයන් ද යෙදී සිටි බව මූලාශ්‍රය අධ්‍යයනයෙන් තහවුරු කර ගැනීමට හැකි වුණි. එම තොරතුරුවලින් එකල රාජ්‍ය සංවිධානය තුළ පැවති රැකියා එසේත් නැති නම් වෘත්තීන් කවරේ ද යන්නත්, එම නිලධාරීන් හා ඔවුන්ගේ පවුල්වලට සම්බන්ධ පිරිස් විසින් සංඝයා වහන්සේලා උදෙසා කළ ලෙන් පූජාවන්ගෙන් ඔවුන්ගේ ආර්ථික පරිසරය කෙබඳු තත්ත්වයක පැවැතියේ ද යන්නත්, එසේම ඔවුන් එම ලේඛනවල දී තමන්ට හා තම පවුලට හිමි සමාජ තත්ත්වය කෙබඳු වූවක් ද යන්න පෙන්වා දීමට යත්න දැරීමෙන් ලෙන් පූජාවන්ට දායකත්වය දැක් වූ පිරිසගේ සමාජ පසුබිමත් ඔවුන්ට හිමි සමාජ තත්ත්වයත් හඳුනා ගැනීමට හැකියාව ලැබුණි.

ඉහත සඳහන් කරන ලද රාජ්‍ය සංවිධානයට සම්බන්ධ විවිධ වෘත්තීන්වල කටයුතු කළ පුද්ගල චරිත අතීත ශ්‍රී ලංකාවේ සමාජ පරිසරය තුළ ආර්ථිකමය අතින් ශක්තිමත්ව සිටි පිරිසකි. ඔවුන් ආර්ථිකමය අතින් ශක්තිමත් නොවූයේ නම් මේ ආකාරයෙන් විශාල ධනයක් වැයකරමින් ලෙන් විහාර ඉදිකිරීමට හැකියාව ලැබෙන්නේ නැත. මෙම ලෙන් පූජා කරන ලද චරිත තුළින් පෙන්වා දෙන අනෙක් වැදගත් කරුණ වන්නේ බුදුසසුනේ චිරස්ථිතිය සඳහා දායකත්වය දක්වන ලද බහුවිධ සමාජ පරිසරය කෙබඳු වූවක් ද යන්න හඳුනා ගැනීමට හැකියාව ලැබීමයි. පැරණි ශ්‍රී ලංකාවේ රාජ්‍ය තන්ත්‍රයට ඍජු සම්බන්ධතාවක් දක්වන විවිධ මාදිලියේ වෘත්තීන් කවරේ ද ? මේ කියනු ලබන වෘත්තීන්හී නියැලී සිටි අයගේ සමාජ තත්ත්වය හා සමාජ ක්‍රියාකාරිත්වය කෙබඳු වූවක් ද යන්න බ්‍රාහ්මී ශිලා ලේඛන මූලාශ්‍රය ඇසුරෙන් අනාවරණය කරගැනීමට හැකියාව ලැබුණි. සාකච්ඡාවට බඳුන් කළ රාජ්‍ය නිලතලවලට අති බහුතරයක් පරුමක හා ගමික යන විරුදය දැරූ අය අතුරෙන් තෝරාපත් කරගත් බවක් දක්නට පුළුවන. එම සමාජ කණ්ඩායම් ද්විත්වයෙන් පරිබාහිරව එම තනතුරුවලට පත්ව ඇත්තේ ඉතාමත් අතළොස්සක් පමණි. පරුමකවරු හා ගමිකයන් සමකාලීන සමාජ පරිසරය තුළ සමාජ තත්ත්වයකට මෙන්ම බලයකට ද හිමිකම් කියන බැවින් ඔවුන් අතුරෙන් සුදුසුකම් සහිත පිරිස් රාජ්‍ය තන්ත්‍රයේ තනතුරුවලට බඳවා ගන්නට ඇතැයි කල්පනා කළ හැකි ය. එකල පාලකයන් සමඟ සමීප සබඳතා ගොඩනගා ගැනීමට පරුමක හා ගමිකයන්ට හැකියාව ලැබීම නම් වූ සාධකය ද මෙම තනතුරු ලැබීමට ඉවහල් වන්නට ඇතැයි අනුමාන කළ හැකි ය. පැරණි ශ්‍රී ලාංකේය රාජ්‍ය තන්ත්‍රය, සමාජ හා ආර්ථික පරිසරයට සම්බන්ධ මෙවැනි වැදගත් කරුණු රැසක් බ්‍රාහ්මී ශිලා ලේඛන මූලාශ්‍රය ඇසුරෙන් අනාවරණය කරගැනීමට හැකියාව ලැබෙන බැවින් එම මූලාශ්‍රයට මෙරට ඉතිහාසය අධ්‍යයනයේදී සුවිශේෂිත වැදගත්කමක් හිමිවන බව මෙයින් පෙන්වා දීමට පුළුවන.

කෙටියෙදුම්

අ. ශා.	- අර්ථශාස්ත්‍රය
ඌ. පූ. ම.	- ඌනපූරණසහිතො මහාවංසො
ම. භා.	- මහාභාරතය

ම. මෘ. - මනුස්මෘතිය
ශු. නී. - ශුක්‍රනීති
IC - Inscriptions of Ceylon

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අමරවංශ හිමි, කොත්මලේ, (1969), ලක්දිව සෙල්ලිපි, කොළඹ: සීමාසහිත ඇම්.

අර්ථශාස්ත්‍රය, (අධිකාර 1-2), (2003) (අනුවාදක.), හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

අර්ථශාස්ත්‍රය, (අධිකාර 8-15) (2003), (අනුවාදක.), හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ඌනපූරණසහිතො මහාවංසො, (1959), (සංස්.), පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන නාම සීමිත සමිතිය.

භාෂා ටීකා සහිත ශුක්‍රනීති, (1, 2, 3, 4), (1952), (සංස්.), ඛේමරාජ - ශ්‍රී කෘෂ්ණදාස, ඉන්දියා: කර්තෘ ප්‍රකාශනයකි.

මනුස්මෘතිය හා මානව ශිෂ්ටාචාරය, (2001), (පරි.), නාගොඩ ආරියදාස සෙනෙවිරත්න, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

මහාභාරතය, (ශාන්ති පර්වය), හනුමානප්‍රසාද පෝද්දර ප්‍රකාශන, (ඉන්දියා), (වර්ෂයක් සඳහන් නොවේ) මූලාශ්‍රය අන්තර්ජාලය.

මහාභාරතය, (ශාන්ති පර්වය 1 කොටස), (2006), (පරි.), හිරිපිටියේ පඤ්ඤාකිත්ති හිමි, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Inscriptions of Ceylon, Vol.I. (Early Brāhmī Inscriptions) (1970), (ed.) Paranavitana, S., Colombo: Published by the Department of Archaeology.